පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

2026.10.08

මහ ලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**<u>කථානායක ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතාට එරෙහි විශ්වාසභංගත්ව යෝජනාව</u>**

ශ්‍රී ලංකා දසවන පාර්ලිමේන්තුවේ කථානායක ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා විසින් සිය ධුරයේ කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කිරීමේදී කටයුතු කරනු ලැබූ හා කටයුතු කරනු ලබන ආකාරය හේතුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත, 1982 අංක 12 දරන පොදු දේපළ පනත, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත, 1953 අංක අංක 21 පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් 2018 මාර්තු මස 07 වන දින අනුමත කරනු ලදුව, 2018 අප්‍රේල් මස 15 වන දින සිට ක්‍රියාත්මක විය යුතුයැයි සම්මත කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය හා 2026 අප්‍රේල් මස 07 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කර සම්මත කරන ලද ස්ථාවර නියෝග ඇතුළු මෙරට තුළ වලංගු හා බලාත්මක අනෙකුත් නෛතික ප්‍රතිපාදන හිතාමතා හා චේතනාන්විතවම උල්ලංඝනය කර ඇති හෙයින්ද;

රටේ මහජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක කරන උත්තරීතරම ආයතනය වන පාර්ලිමේන්තුවේ හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබසාධනයේ සාධාරණ අවශ්‍යතා සපුරාලීම පිණිස අල්ලස් හා දූෂණ වැළැක්වීම හා තුරන් කිරීම සඳහා ස්ථාපිත කර ඇති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ගෞරවය, ස්වාධීනත්වය, පාලනයේ විනිවිදභාවය වර්ධනය කිරීම, පාලනයේ අවංකභාවය ශක්තිමත් කිරීම හා වගකිවයුතු බව වැඩි කිරීම සහ මහජන විශ්වාසය වර්ධනය කිරීම සහ දූෂණය තුරන් කිරීම සඳහා වන මහජන සහභාගීත්වය ශක්තිමත් කිරීමේ ඒකායන අරමුණින් යුතුව පහත සඳහන් යෝජනාව මෙම ගරු සභාවට ඉදිරිපත් කරමු.

(1) පාර්ලිමේන්තුවේ කථානායකවරයාගේ නිල නිවස ආයතන සංග්‍රහයේ 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදය යටතේ උපලේඛනගත නිල නිවසක් වන අතර, එසේ එවැනි නිල නිවසක් හිමිව තිබියදී හා එකී නිල නිවස වර්තමාන ගරු කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් රාජකාරී හා පෞද්ගලික කටයුතු සඳහා භාවිත කරමින්ම ඊට අතිරේකව නිල නිවාස නොමැති අමාත්‍යවරුන් හෝ නියෝජ්‍ය අමාත්‍යවරුන් හෝ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සහනදායී කුලී පදනමක් මත ලබාදෙනු ලබන කොළඹ 04, ලොරිස් පටුමඟ පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් මහල් නිවාස සංකීර්ණයෙන් නිල නිවසක් ලබාදෙන ලෙස නීති විරෝධී ලෙස ඉල්ලීමක් සිදුකර ඒ අනුව, අංක 8-1 දරන රජයේ නිල නිවස 2025 ජනවාරි මස සිට තම නමට වෙන්කරවා ගෙන භාවිත කිරීම හේතුවෙන් හිතාමතා හා දැන දැනම තම අධිකාරි බලය අනිසි ලෙස භාවිත කරමින් ආයතන සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කර ඇති හෙයින්ද, හා එමගින් රජයේ දේපළ අවභාවිත කර ඇති හෙයින්ද, එකී උල්ලංඝනය කිරීම 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ "දූෂණය" නැමැති වරද යටතට ගැනෙන වරදක් වන හෙයින්ද;

(2) ඉහත කී කොළඹ 04, ලොරිස් පටුමඟ පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් මහල් නිවාස සංකීර්ණයෙන් අංක 8-1 දරන රජයේ නිල නිවස භාවිත කරමින්ම බත්තරමුල්ල, රජමල්වත්ත පිහිටි කථානායක නිල නිවසේ නඩත්තුව සඳහා 08 දෙනෙකුගෙන් සමන්විත පෞද්ගලික කාර්ය මණ්ඩලයක් පත් කරමින් එකී කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා සඳහා මසකට රු. 760,000/-කට අධික මුදලක් ද, එකී නිල නිවස සඳහා ජල, විදුලි බිල්පත් හා නඩත්තුව සඳහා අවශ්‍ය කෙරෙන අනෙකුත් බඩු භාණ්ඩ සඳහා යන වියදම් ද පාර්ලිමේන්තු ගිණුමෙන් ගෙවීමට පෙළඹවීමෙන් පාර්ලිමේන්තුව වෙත හිතාමතා දැන දැනම බරපතළ මූල්‍යමය අලාභයක් සිදුකිරීමට කටයුතු කරනු ලබන හෙයින්ද;

(3) එමෙන්ම, තමාගේ පෞද්ගලික ලේකම්වරයා වන චමීර ප්‍රියශංක ගාල්ලගේ යන අයට ද නිල නිවාස නොමැති අමාත්‍යවරුන් හෝ නියෝජ්‍ය අමාත්‍යවරුන් හෝ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා සහනදායී කුළී පදනමක් මත ලබාදෙනු ලබන කොළඹ 04, ලෝරිස් පටුමඟ සුඛෝපභෝගී මහල් නිවාස සංකීර්ණයෙන් අංක 4-3 දරන නිල නිවස ලබාදීම සඳහා පෞද්ගලිකව මැදිහත් වීම තුළින් රජයට මූල්‍ය පාඩුවක් සිදුකරමින් රාජ්‍ය දේපළ අවභාවිත කිරීම සඳහා ආධාර අනුබල දීම සිදුකර ඇති හෙයින්ද;

(4) බත්තරමුල්ල, රජමල්වත්ත පිහිටි කථානායක නිල නිවසේ උපලේඛන ගත භාණ්ඩ වන ඇඳ ඇතිරිලි, කොට්ට උර, තුවා ඇතුළු අනෙකුත් උපකරණ නිසි අනුමැතියකින් තොරව එකී නිල නිවාස පරිශ්‍රයෙන් පිටතට ගෙන්වා ගැනීමට කටයුතු කිරීමෙන් අදාළ චක්‍රලේඛ හා විධිවිධාන උල්ලංඝනය කර උපලේඛනගත රජයේ දේපළ අවභාවිත කර ඇති හෙයින්ද;

(5) බත්තරමුල්ල, රජමල්වත්ත පිහිටි කථානායක නිල නිවස කිසිඳු නිල රාජකාරී හෝ පෞද්ගලික කටයුත්තක් සඳහා භාවිත කරනු නොලබන බවට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක සභාව, සමස්ත පාර්ලිමේන්තුවම හා මහජනතාව වෙත ප්‍රකාශ කරමින් එකී නිල නිවස කථානායකවරයා සභාපතීත්වය දරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ රැස්වීම් සඳහා භාවිත කරමින් ශ්‍රී ලංකා පාර්ලමේන්තුව හා සමස්ත මහජනතාව ද නොමඟ යැවීමට කටයුතු කරමින් තමා කෙරෙහි තබා ඇති මහජන විශ්වාසය පළුදු කරගෙන සාපරාධී විශ්වාසය කඩ කිරීම සිදුකර ඇති හෙයින් ද,

(6) තවද, කොළඹ 04, ලොරිස් පටුමඟ පිහිටි රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් මහල් නිවාස සංකීර්ණයෙන් නිල නිවසක් භාවිත කරමින් සිටියදීම පාර්ලිමේන්තුවට අයත් බත්තරමුල්ල, රජමල්වත්ත පිහිටි කථානායක නිල නිවස පෞද්ගලික දිවා හා රාත්‍රී භෝජන සංග්‍රහ සඳහා ද, තම පෞද්ගලික පරිහරණය සඳහා ද භාවිත කිරීමට කටයුතු කිරීමෙන් කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා විසින් සාපරාධී සාවද්‍ය පරිහරණය හා සාපරාධී විශ්වාසය කඩ කිරීම සිදුකර ඇති හෙයින්ද;

(7) කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් බත්තරමුල්ල, රජමල්වත්ත පිහිටි කථානායක නිල නිවසේ ඇඳ ඇතිරිලි, තුවා, කොට්ට උර ආදී බඩු බාහිරාදිය අනවසරයෙන් පිටතට ගෙන ගොස් ඇති බවට එල්ල වී ඇති චෝදනාව සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදු කරමින් සිටින අවස්ථාවකදී එකී නිල නිවසේ ඇඳ ඇතිරිලි, තුවා, කොට්ට උර ආදී භාණ්ඩ සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලැබූ භාණ්ඩ වට්ටෝරු ලේඛනය භාරව සිටින නිල නිවසේ සේවකයා විසින් එකී ලේඛනය අස්ථානගත වී ඇති බවට දැනුම් දී ඇති අතර, එම නිල නිවසේ සේවකයා කථානායක ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් පත් කරන ලද පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවකයෙකු වන හෙයින්ද, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 127 වගන්තිය ප්‍රකාරව එකී පනත යටතේ විමර්ශනයකට අදාළ යම් ලේඛනයක් සැඟවීම, විනාශ කිරීම හෝ බැහැර කිරීම සඳහා කටයුතු සලස්වන හෝ අවසර දෙන හෝ ඊට ආධාර අනුබල දීම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර 07ක නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ

ගැනෙන වරදක් වන හෙයින්ද, කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් එකී වරද බැලූ බැල්මටම සිදුකර ඇති බවට සාධාරණ සැකයක් මතුවන හෙයින්ද;

(8) 2025.03.21 දිනැති පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව විසින් ජනාධිපති ලේකම්ගේ පීඑස්/සීඑස්ඒ/00/1/4/12 අංක දරන 2025.01.21 දිනැති චක්‍රලේඛය අනුව ගරු කථානායකතුමා හට කැබිනට් අමාත්‍යවරයෙකුට සමාන වාහන හා ඉන්ධන දීමනා ලබා ගත යුතු බව තීරණය කර ඇති අතර, ඒ අනුව පාර්ලිමේන්තු මහ ලේකම් විසින් නිකුත් කරන ලද අංක 14/2025 දරන 2025.05.07 දිනැති පරිපාලන චක්‍රලේඛය අනුව 2025.05.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු කථානායකතුමාගේ පරිහරණය සඳහා උපරිම වශයෙන් නිල වාහන දෙකක් ද, එකී වාහන සඳහා උපරිම ඉන්ධන ලීටර් 900ක් ද විය යුතු වන නමුත්, කථානායක ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා විසින් තම ධුරයේ බලතල යොදා ගනිමින් පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත අනිසි ලෙස බලපෑම් සිදුකරමින් තමාට නිල වශයෙන් හිමි වාහන දෙකට අමතරව, පාර්ලිමේන්තුව සතු WP NC 4923 දරන වෑන් රථය ඇතුළු තවත් පාර්ලිමේන්තුව සතු වාහන තම පෞද්ගලික පරිහරණයට භාවිත කරන අතර, ඉහතින් අනුමත ඉන්ධන දීමනාවන්ට අමතරව එකී රථ සඳහා ද ඉන්ධන ලබාගෙන ඇති හෙයින්ද;

(9) මීට පෙර හිටපු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හට අමාත්‍ය මණ්ඩලය විසින් ඔහුගේ ධුර කාලය සඳහා පමණක් පෞද්ගලික වන සේ මාධ්‍ය ඒකකයක් ස්ථාපිත කිරීමට අනුමැතිය ලබාදී තිබූ අතර, ඔහුගේ ධුර කාලය අවසන් වීමත් සමඟ එකී අනුමැතිය අවසන් වී තිබියදී කිසිදු අනුමැතියකින් තොරව වර්තමාන කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා විසින් කථානායක මාධ්‍ය ඒකකය නමින් නීතිවිරෝධී ඒකකයක් පවත්වාගෙන යමින් එකී ඒකකය සඳහා පාර්ලිමේන්තුවේ සන්නිවේදන ඒකකයට අයත් උපකරණ අනීතිකව ලබා ගනිමින් එකී රථ වාහන හා උපකරණ පාර්ලිමේන්තුවේ වියදමින් නඩත්තු කරමින් හිතාමතා දැන දැනම සාපරාධී, සාවද්‍ය පරිහරණයක් හා රජයට මූල්‍යමය පාඩුවක් සිදුකරමින් සිටින හෙයින්ද;

(10) ඉහත (9)හි සඳහන් අනුමැතියකින් තොර කථානායක මාධ්‍ය ඒකකය සඳහා අතීතයට බලපාන පරිදි නීත්‍යානුකූලභාවයක් ලබා ගැනීමට අසද්භාවයෙන් කටයුතු කරමින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක සභාව ද නොමඟ යවමින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු අග්‍රාමාත්‍යතුමිය මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත, මුදල් අමාත්‍යාංශයේ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත හා ජනාධිපති ලේකම්වරයා වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ ද එකී සියලු පුද්ගලයින් හා ආයතන විසින් ඒ සඳහා අනුමැතිය ලබාදීම සිදුකර නොමැති බව දැන දැනම තවදුරටත් නීතිවිරෝධී හා අනීතික ආකාරයෙන් පාර්ලිමේන්තුව සතු වාහන හා උපකරණ එකී නීතිවිරෝධී කථානායක මාධ්‍ය අංශයේ භාවිතයට යොදා ගැනීමට කටයුතු කරනු ලබන හෙයින්ද;

(11) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකවරයාට දිවා ආහාර ලබා ගැනීමේ පහසුව සලසා ඇත්තේ පාර්ලිමේන්තුවේ දෙවන මහලේ පිහිටි ගරු කථානායකවරයාට වෙන් කර ඇති දිවා ආහාර ගන්නා කාමරය තුළ වන අතර, කථානායකවරයාගේ පෞද්ගලික ලේකම්වරයාට ආහාර ගැනීමට වෙන්කර ඇත්තේ විධායක නිලධාරීන්ගේ භෝජනාගාරය වන අතර, ඒ ඒ භොජනාගාරවල පහසුකම් භුක්තිවිඳීම වෙනුවෙන් පාර්ලිමේන්තුව මඟින් අයකරනු ලබන මුදල ද වෙනස් වන අතර, එසේ තිබියදී වර්තමාන කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා තම පෞද්ගලික ලේකම් චමීර ගාල්ලගේ මහතා සමඟ කථානායකවරයාගේ පෞද්ගලික භෝජනගාරය තුළ දිවා ආහාර ලබා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් කථානායකවරයාගේ අමුත්තෙකු සඳහා අයකරනු ලබන මුදල කථානායකවරයා විසින් ගෙවිය යුතු වුවද එසේ නොගෙවා එකී දිවා භෝජන පහසුකම් ලබා ගැනීම හේතුවෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත මූල්‍යමය වශයෙන් අලාභයක් සිදුකිරීමට කටයුතු කරනු ලබන හෙයින්ද;

(12) පාර්ලිමේන්තුවේ අභ්‍යන්තරිකව පැවතෙන කාරක සභා රැස්වීම් හා අනෙකුත් විශේෂිත කමිටු රැස්වීම් සඳහා සහභාගී විය හැක්කේ ඒ සඳහා සහභාගී වීමට බලයලත් මන්ත්‍රීවරුන්ට, පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට හා බලයලත් රාජ්‍ය නිලධාරීන්ට පමණක් වන නමුත්, ගරු කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතාගේ පෞද්ගලික ලේකම් චමීර ප්‍රියශංක ගාල්ලගේ මහතාහට පාර්ලිමේන්තුවේ කටයුතු තීරණය කරන පක්ෂ නායකයින් සහභාගී වන "පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව", පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ කටයුතු පිළිබඳ සාකච්ඡා වන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක සභාව ඇතුළු කාරක සභා හා කමිටු රැස්වීම් සියල්ල සඳහාම නිසි අනුමැතියක් හෝ බලයක් නොමැතිව සහභාගී වීම සඳහා ආධාර අනුබල දෙමින් කටයුතු කිරීම හේතුවෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග හා සම්ප්‍රදායන් හිතාමතා හා චේතනාන්විතවම උල්ලංඝනය කර ඇති හෙයින්ද;

(13) 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් කථානායකවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය, ඔහුගේ මාධ්‍ය ඒකකය හා එකී ඒකකයට ලබා දී ඇති බඩුභාහිරාදිය, ඔවුන්ගේ වැටුප් හා දීමනා හා ඔවුන් භාවිත කරන නිල රථ පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යටතේ ඇති ප්‍රතිපාදන අවභාවිත කරමින් වර්තමාන ගරු කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා විසින් හා ඔහුගේ උපදෙස් පරිදි ඔහුගේ පෞද්ගලික ලේකම් චමීර ගාල්ලගේ මහතා විසින් ඉහතින් දක්වන ලද 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ ප්‍රතිපාදනවලට පටහැනිව එකී තොරතුරු ලබා නොදෙන ලෙස පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරීන් වෙත ලිඛිතව නියෝග ලබාදීමෙන් එකී තොරතුරු දැනගැනීමේ පනතේ විධිවිධාන උල්ලංඝනය කර ඇති හෙයින්ද;

(14) ඉහත (13)හි සඳහන් ආකාරයෙන් කටයුතු කිරීම තුළින් ගරු කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා තමා විසින් සිදුකරනු ලබන රාජ්‍ය මුදල් අවභාවිතය හා රජයට මූල්‍යමය පාඩු සිදුකරමින් කරනු ලබන කටයුතු අධිකාරි බලය අවභාවිත කරමින් හෙළිදරව් වීම වැළැක්වීමට කටයුතු කිරීම මඟින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ "දූෂණය" නැමැති වරද සිදුකරන හෙයින්ද;

(15) කාර්ය මණ්ඩල ප්‍රධානී හා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් වශයෙන් කටයුතු කළ ජී.කේ.ඒ. චමින්ද කුමාර කුලරත්න මහතා සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකිරීමට තමා වෙත නැති බලයක් ආරෝපණය කර ගනිමින් රාජ්‍ය පරිපාලන හා මුදල් අමාත්‍යාංශයන්හි චක්‍රලේඛයන්හි විධිවිධානවලට පරිබාහිරව නීතිවිරෝධී ලෙස විමර්ශන නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර, එකී විමර්ශන නිලධාරියා හට අනීතිකව රු. 274,975/-ක මුදලක් 2025.11.17 දිනැති පාර්ලිමේන්තුවේ ලංකා බැංකු ශාඛාවෙන් නිකුත් කරන ලද 293566 දරන චෙක් පත මඟින් පාර්ලිමේන්තු ගිණුමෙන් ගෙවීම සඳහා පෙළඹවීමෙන් ද ඊට අතිරේකව එකී නීතිවිරෝධී විමර්ශන නිලධාරියා වෙත පාර්ලිමේන්තු ගිණුමෙන් ආහාර හා ප්‍රවාහන පහසුකම් ලබාදීමට උපදෙස් ලබාදීමෙන්ද, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ගිණුමෙන් එකී ප්‍රතිපාදන වැය කිරීමට සැලැස්වීම හේතුවෙන් කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් පාර්ලිමේන්තුව සතු රජයේ මුදල් සාපරාධී ලෙස පරිහරණය කිරීමෙන් රජයට මූල්‍යමය අලාභයක් සිදුකර ඇති හෙයින්ද;

(16) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලය හා අනුබද්ධ කාර්ය මණ්ඩලයන් වෙත චිරාත් කාලයක් තිස්සේ ලබාදෙන ලද දිරි දීමනා හා පහසුකම් කප්පාදු කිරීමට කටයුතු කිරීමෙන් පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය තුළ තම රැකියාව පිළිබඳ තෘප්තිමත්භාවය නැති කිරීමට කටයුතු කිරීමට ඉඩ සැලසීමෙන්, කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය කථානායක ධූරය කෙරෙහි තබා ඇති විශ්වාසය හා ගෞරවය පළුදු කරගෙන ඇති හෙයින්ද;

(17) කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය විසින් සිදුකරනු ලබන අනීතික ඉල්ලීම් සඳහා ඉඩ ප්‍රස්ථා ලබා නොදෙන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් ස්ථාන මාරු කිරීමට හා ඔවුන් කැඳවා දෝෂාරෝපණයට ලක් කිරීමට කටයුතු කිරීම තුළින් පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර පාලනයට අනීතිකව මැදිහත් වෙමින් කථානායකවරයා හා ඔහුගේ පෞද්ගලික ලේකම් චමීර ප්‍රියශංක ගාල්ලගේ යන අය "තමාට නොමැති බලයක් ආරෝපිතව කටයුතු කිරීම" (Ultra vires) සිදුකිරීම මඟින් ස්වාභාවික යුක්ති මූලධර්මයන් හිතාමතා හා චේතනාන්විතවම උල්ලංඝනය කර ඇති හෙයින්ද;

(18) පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වාර්තාවක් සකස් කිරීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක සභාවේ උපදෙස් පරිදි මීට පෙර කමිටුවක් පත්කර ඒ සඳහා රුපියල් ලක්ෂ 20ක පමණ මුදලක් වැය කර වාර්තාවක් සකස් කර තිබියදී වර්තමාන කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් එකී වාර්තාව ප්‍රමාණවත් නොවන හා පිළිගත නොහැකි බවට හේතු දක්වමින් අත්තනෝමතික ලෙස ප්‍රකාශ කර කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා නව වාර්තාවක් සකස් කිරීමට විශ්‍රාමලත් නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර, එකී නව ත්‍රිපුද්ගල කමිටු වාර්තාව සඳහා පාර්ලිමේන්තු ගිණුමෙන් රු. 3,262,477.42/- (රුපියල් තිස් දෙලක්ෂ හැට දෙදහස් හාරසිය හැත්තෑ හතයි සත හතළිස් දෙකක්) මුදලක් වැය කිරීමට කටයුතු කර පාර්ලිමේන්තු ගිණුමට හිතාමතා හා චේතනාන්විතවම අලාභයක් සිදු කිරීමට කටයුතු කර ඇති හෙයින්ද;

(19) ඉහතින් සඳහන් කරන ලද නීතිවිරෝධී හා දූෂණ ක්‍රියා එකක් හෝ කිහිපයක් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඒසී/0356/2026 බී - 206 අංක දරන විමර්ශනය ආරම්භ කර ඇත. එකී පරීක්ෂණය සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන් විසින් මේ වන විට ප්‍රකාශයන් හා ලිපි ලේඛන සාක්ෂි වශයෙන් ලබාදී ඇති අතර, ඉදිරියේදී ද තවදුරටත් එකී විමර්ශනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන්ගෙන් ප්‍රකාශයන් හා සාක්ෂි ලබාදීමට නියමිතව ඇත. එමනිසා වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා මෙම පාර්ලිමේන්තුවේ කථානායක ධුරය දැරීම මෙකී විමර්ශනය අපක්ෂපාතීව, බලපෑමකින් තොරව හා විනිවිදභාවයෙන් යුතුය සිදුකිරීමට බාධාවක් වන හෙයින්ද;

(20) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඉහත (19)හි සඳහන් විමර්ශනය සිදුකරමින් තිබියදී කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතාගේ උපදෙස් පරිදි ඔහුගේ පෞද්ගලික ලේකම් චමීර ප්‍රියශංක ගාල්ලගේ මහතා විසින් එකී විමර්ශනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගෙන් වාර්තාවක් කැඳවීමට කටයුතු කිරීම හේතුවෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ පරීක්ෂණ සඳහා මැදිහත්වීමක් හා බලපෑමක් කිරීම හා/හෝ ඊට අධාර අනුබල දීම නැමැති වරද සිදුකර ඇති හෙයින්ද; හා ඒ සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති අතර, එකී පැමිණිල්ල සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් AC/0695/2026 යන අංකය යටතේ විමර්ශනයක් ද ආරම්භ කර ඇති හෙයින්ද;

(21) එබැවින්, පාර්ලිමේන්තුවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන ගරු කථානායකතුමා යටතේ සේවය කරන නිලධාරීන්ට එතුමා සම්බන්ධයෙන් සාක්ෂි හා තොරතුරු ලබාදීමේදී අපක්ෂපාතී හා ස්වාධීනව කටයුතු කිරීමට හැකි වේ ද යන්න පිළිබඳ සාධාරණ සැකයක් ඇතිවිය හැකි බැවින් ගරු කථානායකතුමා හෝ ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වෙතින් අදාළ විමර්ශනය සඳහා තොරතුරු හෝ සාක්ෂි ලබාදෙන පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් හට බලපෑමක් සිදු කිරීමට ඉඩකඩක් තිබෙන හෙයින්ද;

(22) මේ අනුව දැනටමත් කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතාගේ හා ඔහුගේ පෞද්ගලික ලේකම්ගේ නීතිවිරෝධී මැදිහත්වීම මෙම විමර්ශනය සඳහා සිදුවන බවට පැහැදිලි සාක්ෂි ඉදිරිපත් වී ඇති හෙයින්, ගරු කථානායකතුමා හෝ ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් විසින් මෙකී විමර්ශනයට අදාළව සාක්ෂි ලබාදෙනු ලබන පාලන අංශයේ, මූල්‍ය අංශයේ හා ප්‍රවාහන අංශයේ නිලධාරීන් කථානායක කාර්යාලයට ගෙන්වා ගැනීමටත්, දුරකථන මාර්ගයෙන් ඔවුන් වෙත මෙකී විමර්ශනය සම්බන්ධයෙන් යම් යම් බලපෑම් සිදු කිරීමත් කරනු ලබන බව දැන ගැනීමට ලැබී ඇති හෙයින්ද;

(23) දූෂණ විරෝධී පනතේ 3(4) සහ 3(5) වගන්ති අනුව කොමිෂන් සභාවේ බලතල හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ කිරීමට මැදිහත් වන හෝ මැදිහත්වීමට තැත් කිරීම බරපතළ වරදක් වන හෙයින්, තමා සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුවන අවස්ථාවකදී හා එකී විමර්ශනයට අවශ්‍ය තොරතුරු හා සාක්ෂි ලබාදෙන නිලධාරීන් තමා යටතේ සේවය කරනු ලබන අවස්ථාවකදී, එමෙන්ම එකී නිලධාරීන්ට සාක්ෂි සම්බන්ධයෙන් සෘජු බලපෑම් එක එල්ලේ සිදුවන බවට කරුණු පවතින අවස්ථාවකදී වර්තමාන කථානායක ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා තවදුරටත් උත්තරීතර පාර්ලිමේන්තුවේ ප්‍රධානියා වශයෙන් කථානායක ධුරය දැරීම නීත්‍යානුකූලව හා සදාචාරාත්මකව අයිතියක් නොමැති හෙයින්ද;

(24) කථානායකවරයාට විරුද්ධව අල්ලස් කොමිසම විසින් විමර්ශනයක් ආරම්භ කර ඇති බව මාධ්‍ය මඟින් ප්‍රකාශ කොට තිබියදී එකී විමර්ශනයට අදාළ චෝදනා සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 23 වන දින හෝ 2026 පෙබරවාරි 24 වන දින "සිරස" මාධ්‍ය ආයතනය විසින් ප්‍රචාරය කරන ලද "One to One" නමින් හා "දවස - Today" යන වැඩසටහන් සඳහා සහභාගී වෙමින් තමා වෙත එල්ල වී ඇති වාහන අවභාවිතය, ඉන්ධන අවභාවිතය හා නිල නිවාස අවභාවිතය යන චෝදනා සම්බන්ධයෙන් සෘජුවම සාකච්ඡා කරමින් එකී විමර්ශනයට බලපෑමක් එල්ල කිරීමට උත්සාහ දරා ඇති හෙයින්ද, එමෙන්ම, එම සම්මුඛ සාකච්ඡා පටිගත කිරීම සඳහා පාර්ලිමේන්තු පරිශ්‍රය, පාර්ලිමේන්තුවේ ගෘහ භාණ්ඩ ඇතුළු උපකරණ හා පාර්ලිමේන්තු මාධ්‍ය ඒකකයට අයත් කැමරා උපකරණ ද භාවිත කිරීම හේතුවෙන් දූෂණ විරෝධී පනත යටතේ "දූෂණය" නැමැති වරද ස්ථාපනය වන ආකාරයෙන් කටයුතු කර ඇති හෙයින්ද;

(25) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 162 වගන්තිය යටතේ ඇති "රජයේ සේවකයා" යන අර්ථ දැක්වීමට කථානායවරයා ද ඇතුළත් වන අතර, එම පනතේ 2 වන වගන්තියේ සඳහන් පරමාර්ථ අතර අල්ලස් හා දූෂණ වැළැක්වීම හා තුරන් කිරීම, පාලනයේ විනිවිදභාවය වර්ධනය කිරීම, පාලනයේ අවංකභාවය ශක්තිමත් කිරීම, වගකිව යුතු බව වැඩි කිරීම, ආණ්ඩුව පිළිබඳ මහජන විශ්වාසය වර්ධනය කිරීම සහ දූෂණය තුරන් කිරීම සඳහා වන මහජන සහභාගීත්වය ශක්තිමත් කිරීම ඇතුළත් වන අතර, පනතේ 3(4) වගන්තිය යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී කොමිෂන් සභාව සම්බන්ධයෙන් විධාන කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා නීතිය යටතේ හිමිකම් ලැබූ අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් හැර වෙනත් යම් තැනැත්තෙකු විසින් කරනු ලබන යම් විධානයක් හෝ වෙනත් යම් මැදිහත් වීමකින් තොරව ස්වකීය බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ කිරීම කරනු ලැබිය යුතු බව සඳහන් කර ඇති හෙයින්, කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා රටේ උත්තරීතරම ආයතනය වන පාර්ලිමේන්තුවේ ප්‍රධානත්වය දැරීම නීත්‍යානුකූල හා සදාචාරාත්මකව නුසුදුසු වන හෙයින්ද;

(26) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 107(1) හා 107(2) වගන්ති අනුව, යම් රජයේ සේවකයෙකු පොදු අධිකාරියක් හෝ එම අධිකාරිය විසින් ගනු ලබන තීරණයක් සම්බන්ධයෙන් තමාට සෘජු හෝ වක්‍ර බලපෑමක් ඇති අවස්ථාවකදී ඒ රජයේ සේවකයා විසින් ඒ තීරණයට අදාළ පොදු අධිකාරියේ යම් කටයුත්තකදී ඡන්දය දීම හෝ ඒ කටයුත්ත සඳහා සහභාගී වීම නොකළ යුතු බව සඳහන් කර ඇති අතර, එසේ තිබියදී මෙම පාර්ලිමේන්තුව හමුවේ ඉදිරිපත් කර ඇති දූෂණ විරෝධී පනත සඳහා සංශෝධනය 2026 අගෝස්තු මස 19 වන දින ගරු අග්‍රාමාත්‍යතුමිය විසින් පළමු වන වර කියවන ලද අතර, එම අවස්ථාවේදී කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා පාර්ලිමේන්තුවේ මූලාසනයේ සිටීම මඟින් ඉහතින් දක්වන ලද දූෂණ විරෝධී පනතේ 107 වගන්තිය උල්ලංඝනය කර ඇති හෙයින්ද;

(27) දූෂණ විරෝධී පනතේ මෙකී සංශෝධනය සම්බන්ධයෙන් වන පාර්ලිමේන්තු විවාදය 2026 ඔක්තෝබර් 08 වැනි දින පැවැත්වීමට න්‍යාය පත්‍රය සකස් කර ඇත. ඒ අනුව මෙම පාර්ලිමේන්තුව හමුවේ විවාද කරන අවස්ථාවේ හා දූෂණ විරෝධී පනතේ සංශෝධනය සම්බන්ධ කිසිදු කටයුත්තකට එකී පනතේ ඉහත ප්‍රතිපාදන ප්‍රකාරව වර්තමාන කථානායක ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතාට සහභාගී විය නොහැකි හෙයින්ද;

(28) දූෂණ විරෝධී පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තමාට එරෙහිව විමර්ශනයක් සිදුකරන බව දැන දැනම 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සඳහා 2026 අගෝස්තු මස 19 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද සංශෝධනය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදෙන ලද තීන්දු ප්‍රකාශය කථානායක ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් 2026 සැප්තැම්බර් මස 22 වන දින පාර්ලිමේන්තුවට තමා විසින්ම ඉදිරිපත් කිරීම හේතුවෙන් එකී දූෂණ විරෝධී පනතේම 107 වගන්තිය උල්ලංඝනය කර මහාධිකරණය විසින් වරදකරු කිරීමේදී රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ වසර 07ක නොඉක්මවන කාලයක් සඳහා බරපතළ වැඩ සහිත බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ගැනෙන වරදක් සිදුකර ඇති හෙයින්ද;

(29) එමෙන්ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සෑම පනත් කෙටුම්පතකම කථානායකවරයා විසින් ස්වකීය අත්සන ඇතිව සහතිකයක් සටහන් කළ යුතු වන හෙයින්, මෙම දූෂණ විරෝධී පනතේ සංශෝධනය මෙම පාර්ලිමේන්තුව විසින් සම්මත කළ හොත් වර්තමාන ගරු කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා හට දූෂණ විරෝධී පනතේ 107 වන වගන්තිය අනුව එකී සහතිකය සටහන් කිරීමට නොහැකි වන හෙයින්ද;

(30) තවද, 2026.09.08 වන දින මෙම පාර්ලිමේන්තුවේ ප්‍රධාන වැඩකටයුතු ආරම්භ කිරීමට පෙර ගරු කථානායකතුමා විසින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 31(1)(ආ) වගන්තිය ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් සකස් කරන ලදුව, මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ද සමඟ ඉදිරිපත් කරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2027 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව සභාගත කරන ලද අතර, තමා සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශනයක් ක්‍රියාත්මක කරන අවස්ථාවක කොමිෂන් සභාව සම්බන්ධ කිසිදු කාර්යයකට එතුමාහට සම්බන්ධ විය නොහැකි බව ඉහතින් දක්වන ලද දූෂණ විරෝධී පනතේ 107 වගන්තියේ පැහැදිළිව දක්වා තිබියදී කොමිෂන් සභාවේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ඍජු මැදිහත් වීමක් සිදුකරමින් කථානායකතුමා විසින් හිතාමතා හා දැන දැනම දූෂණ විරෝධී පනතේ එකී වගන්තිය උල්ලංඝනය කර ඇති හෙයින්ද;

(31) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ(2) ව්‍යවස්ථාව අනුව ගරු කථානායකවරයා නිල බලයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙහි සභාපතිවරයා වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනය හා දූෂණ විරෝධී පනතෙහි 4 වන වගන්තිය අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් පත් කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යභාරයක් වන හෙයින්ද; දූෂණ විරෝධී පනතේ 17 වන වගන්තිය අනුව අධ්‍යක්ෂ ජනරාල් පත් කරනු ලබන්නේ ද ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත වන හෙයින්, තමා සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදුකරනු ලබන මෙම අවස්ථාවේදී වර්තමාන කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා හට කථානායකවරයා වශයෙන් නීත්‍යානුකූලව හා සදාචාරාත්මකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති ධූරය දරනු ලැබිය නොහැකි හෙයින්ද;

(32) ඉදිරියේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස් ධුරයක පුරප්පාඩුවක් ඇති වීමට නියමිත අතර, එකී පුරප්පාඩුව පිරවීම සඳහා ගරු ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ කථානායකතුමා සභාපතීත්වය දරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් වන අතර, එමෙන්ම කිසියම් අවස්ථාවකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නිර්දේශ කරනු ලබන නාම යෝජනා සම්බන්ධයෙන් ඡන්ද විමසීමක් පැවැත් වුවහොත් එහි සභාපතිවරයා වශයෙන් "තීරක ඡන්දය" ගරු කථානායකතුමා වෙත හිමි වන හෙයින්ද, ඒ අනුව තම සම්බන්ධයෙන් විමර්ශනයක් පවතින අවස්ථාවකදී එකී විමර්ශනය සම්බන්ධ අවසාන තීරණය ගනු ලබන ආයතනයේ සාමාජිකයෙකු පත් කිරීමේ ක්‍රියාවලිය සඳහා දායකවීම දූෂණ විරෝධී පනතේ 107 වගන්තිය ප්‍රකාරව සිදු නොකළ යුතු බරපතළ වරදක් මෙන්ම, එය ආයතනික ළබැඳියාවන් අතර ගැටුමක් මෙන්ම පාලනයේ විනිවිදභාවය පිළිබඳ මහජන විශ්වාසය සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් ද වන හෙයින්ද;

(33) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ උපලේඛනයේ පළමු වන කොටසේ සඳහන් පරිදි අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් ද, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් ද පත් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් කරනු ලබන නිර්දේශයන් අනුමත කිරීම කථානායකවරයා සභාපතීත්වය දරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිල කාර්යයක් වන අතර, දූෂණ විරෝධී පනතේ 160(1) වගන්තිය යටතේ කිසියම් පුද්ගලයෙකු සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණයක් පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සම්බන්ධයෙන් සහනයක් අපේක්ෂාවෙන් කොමිෂන් සභාවට එරෙහිව අදාළ ඉල්ලීම ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වන හෙයින්, ඒ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් තමා සම්බන්ධයෙන් කරනු ලබන විමර්ශනයේ ප්‍රතිඵලය පිළිබඳව යම් හෙයකින් කථානායකතුමාට සෑහීමකට පත්වීමට නොහැකි වුවහොත් ඒ සම්බන්ධයෙන් සහනයක් අපේක්ෂාවෙන් යා යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත වන හෙයින්, තමා සභාපතීත්වය දරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කිරීම අනුමත කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමන්ලා ඉදිරියේ සහනයක් අපේක්ෂාවෙන් පෙත්සමක් ඉදිරිපත් කිරීමට සිදු වුවහොත් එය ළබැඳියාවන් අතර ගැටුමක් (conflict of interest) මෙන්ම බරපතළ සදාචාරාත්මක ගැටලුවක් ද, අපක්ෂපාතීත්වය හා විනිවිදභාවය පිළිබඳ මහජන විශ්වාසය කඩ කිරීමක් ද වන හෙයින්ද;

(34) 1953 අංක අංක 21 පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් 2018 මාර්තු මස 07 වන දින අනුමත කරනු ලදුව, 2018 අප්‍රේල් මස 15 වන දින සිට ක්‍රියාත්මක විය යුතුයැයි සම්මත කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහයේ 7(ආ) වගන්තිය අනුව,

> *"කිසිම මන්ත්‍රීවරයකු සිය නිල කටයුතු කිරීමේ දී තමාට බලපෑමක් ඇති විය හැකි යම් ආකාරයකට යම් පිටස්තර පුද්ගලයකු හෝ සංවිධානයකට යම් මූල්‍යමය හෝ වෙනත් බැඳීමක් ඇති වන තත්ත්වයකට පත් නොවිය යුතු ය."*

යනුවෙන් දැක්වෙන අතර, එමෙන්ම, එකී ආචාරධර්ම සංග්‍රහයේ 19 වන වගන්තිය අනුව,

> *"පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක සලකා බැලීමට භාජනය වී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් මන්ත්‍රීවරයකුට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් පෞද්ගලික හෝ මූල්‍යමය බැඳියාවක් ඇති අවස්ථාවක එම මන්ත්‍රීවරයා විසින් එම බැඳියාව මන්ත්‍රීවරයන්ගේ අදාළ ලේඛනයේ ලියාපදිංචි කර ඇත්තේ වුව ද, එය නොතකා, එම මන්ත්‍රීවරයා විසින් එම බැඳියාවේ ස්වභාවය ප්‍රකාශ කළ යුතු අතර, ඔහු විසින් මෙම වගන්තියේ නියම කොට ඇති ආකාරයට එම ප්‍රකාශය කර ඇත්නම් මිස පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක ඒ සම්බන්ධයෙන් කරනු ලබන කිසිම විවාදයකට ඔහුට සහභාගී විය නොහැකි ය."*

යනුවෙන් ද දැක්වෙන හෙයින්ද, ඒ අනුව මන්ත්‍රීවරයා යන්නට කථානායකවරයා ද ඇතුළත් වන හෙයින්ද, එතුමා හට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හෝ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත හා සම්බන්ධ කිසිදු කටයුත්කට දායකත්වයක් ලබාදීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය අනුව නීත්‍යානුකූලව මෙන්ම සදාචාරත්මකව ද අයිතියක් නොමැති හෙයින්, ගරු කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ කථානායක ධුරය තවදුරටත් දැරීම නීත්‍යානුකූල හා සදාචාරාත්මක නොවන හෙයින්ද;

(35) එමෙන්ම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහයේ ඉහත කී වගන්ති අනුව විමර්ෂණයට ලක්වන චෝදනා ලැබුවෙකුව සිටියදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමන්ලා පත්කිරීම සම්බන්ධ කිසිදු කටයුත්තකට සම්බන්ධ වීමට ගරු කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා හට නීත්‍යානුකූල හා සදාචාරාත්මක අයිතියක් නොමැති හෙයින්ද;

(36) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයට අනුව කිසිදු මන්ත්‍රීවරයෙකු තමා සම්බන්ධයෙන් ලබැදියාවන් අතර ගැටුම් ඇති වන ආකාරයේ කටයුතු සඳහා මැදිහත් නොවිය යුතුව තිබියදී, තමා සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින් විමර්ශනයක් ආරම්භ කර ඇති බව දැන දැනම එකී කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුව භාරයේ පවතින “ශ්‍රාවස්ති මන්දිරය” තම පරිහරණයට ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී එකී ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නා ලද පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක සභාවේදී ඒ සඳහා මැදිහත්වීම හේතුවෙන් ලබැදියාවන් අතර ගැටුම් ඇතිවන ආකාරයෙන් කටයුතු කර ඇති හෙයින්, ගරු කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය හිතාමතා දැන දැනම චේතනාන්විතවම උල්ලංඝනය කර ඇති හෙයින්ද;

(37) පාර්ලිමේන්තුවේ කථානායක ධුරයට පත්වන පුද්ගලයා ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ ද මන්ත්‍රීවරුන් සඳහා සර්ව සාධාරණව කටයුතු කළ යුතුව තිබියදී කථානායක (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා විසින් සෑම විටම පාර්ලිමේන්තුවේ ආණ්ඩු පාර්ශ්වය වෙත විශේෂ අවධානයක් හා සැලකිල්ලක් දක්වනු ලබන බැව් සාධාරණ දෘෂ්ඨි කෝණයෙන් බැලූ බැල්මටම පෙනී යන හෙයින්ද, විශේෂයෙන්ම වරප්‍රසාද ප්‍රශ්න, රීති ප්‍රශ්න හා වාචික ප්‍රශ්න සඳහා අවස්ථාවන් ලබාදීමේදී විපක්ෂ මන්ත්‍රීවරුන්ට වඩා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වැඩි ඉඩ කඩක් ලබාදීමට කටයුතු කිරීම හේතුවෙන් කථානායක ධුරයේ කටයුතු සාධාරණව හා අපක්ෂපාතීව සිදුකිරීමේ මූලධර්මය උල්ලංඝනය කර ඇති හෙයින්ද; මේ කරුණ සම්බන්ධයෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් අත්සන් කරන ලද පැමිණිල්ලක් මේ වන විටත් අන්තර්-පාර්ලිමේන්තු සංගමයෙහි (Inter-Parliamentary Union) සහ පොදුරාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමයෙහි (Commonwealth Parliamentary Association) හි ගොනුකර ඇති හෙයින්ද; එම පැමිණිල්ල අනුව, පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයට හානි කිරීම, පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධ වගකිවයුත්තන් පිළිබඳ ගෙන් එනු ලබන විශ්වාසභංග ක්‍රියාවලියට බාධා කිරීම සහ ව්‍යවස්ථාදායක යාන්ත්‍රණය අඩපණ කිරීම යන චෝදනා මතු කර ඇති හෙයින්ද;

(38) පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායන්ට හා ස්ථාවර නියෝගයන්ට අනුකූලව ආණ්ඩු පක්ෂ හා විපක්ෂ මන්ත්‍රීවරුන් සඳහා සභාව තුළ අදහස් දැක්වීමට කාලය වෙන්කර දීමේ දී සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයන් යටතේ පිහිටුවා ඇති කාරක සභාවන් සඳහා සාමාජිකයින් පත් කිරීමේදී සෑම විටකදීම පාර්ලිමේන්තු සම්ප්‍රදායන් නොසලකා ආණ්ඩු පක්ෂයට වාසි සහගත හා පක්ෂග්‍රාහී ලෙස කටයුතු කරනු ලබන බව බැලූ බැල්මටම පෙනී යන හෙයින්ද;

(39) පාර්ලිමේන්තු සභා ගර්භය තුළ මූලාසනය දරමින් කටයුතු කරමින් සිටියදී කථානායක ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා විසින් විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අපහාසයට, උපහාසයට හා සමච්චලයට ලක් කරමින් එකී මන්ත්‍රීවරුන්ගේ ගෞරවයට හානි වන ආකාරයෙන් කටයුතු කරනු ලබන හෙයින්ද;

(40) පාර්ලිමේන්තු මන්ත්‍රී ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය විශ්‍රාමික මේජර් ජෙනරාල් අරුණ ජයසේකර මහතා මෙම පාර්ලිමේන්තුව කෙරෙහි විශ්වාසය කඩ කර ඇති බවට විපක්ෂය නියෝජනය කරනු ලබන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් විධිමත් පරිදි අත්සන් කර ඉදිරිපත් කරන ලද විශ්වාසභංග යෝජනාව පාර්ලිමේන්තු න්‍යාය පුස්ථකයට ඇතුළත් කිරීම හා විවාදයට ඉඩ ලබා නොදීම හේතුවෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග හා මෙරට හා විදේශීය පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සම්ප්‍රදායන් උල්ලංඝනය කිරීමට කටයුතු කර ඇති හෙයින්ද; මේ සම්බන්ධයෙන් එකිනෙකට පරයා යන කථානායක නියෝග දෙකක් ලබා දෙමින් එකම කරුණක් අරබයා නියෝග දෙකක් නිකුත් කිරීමේ පාර්ලිමේන්තු සම්ප්‍රදායන් කඩකරමින්, එම විශ්වාසභංග යෝජනාව අතාර්කික ප්‍රතික්ෂේප කිරීම මගින් පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් ඍජුවම විශමාචාර චෝදනා ලද නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා ආරක්ෂා කිරීමට ආධාර අනුබල දුන් හෙයින්ද;

(41) ඉහත (40) කරුණ සම්බන්ධයෙන් ලේකම් මණ්ඩලය විසින් ලබාදුන් වාර්තාව විපක්ෂය විසින් ඉල්ලා සිටියද එය ලබාදීමට කටයුතු නොකිරීම තුළින් කථානායකවරයාගේ ක්‍රියාකලාපයේ විනිවිදභාවය පිළිබඳව විශ්වාසය බිඳවැටුණු හෙයින්ද; මේ නිසා පාස්කු ඉරුදින ප්‍රහාරයට සාධාරණයත්වයක් අපේක්ෂා කරන වින්දිතයන් පාර්ලිමේන්තුව කෙරෙහි තබා ඇති විශ්වාසය කඩකරමින් පාර්ලිමේන්තුවේ කීර්තිනාමයට හානි කිරීම සිදුකළ හෙයින්ද;

(42) අධිකරණ සේවා කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කරන ලෙස විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් විධිමත් ලෙස අත්සන් තබා ඉදිරිපත් කරන ලද යෝජනාව පාර්ලිමේන්තු න්‍යාය පුස්ථකයට ඇතුළත් කිරීම හා විවාදයට ඉඩ ලබා නොදීම හේතුවෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග හා මෙරට හා විදේශීය පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සම්ප්‍රදායන් උල්ලංඝනය කිරීමට කටයුතු කර ඇති හෙයින්ද;

(43) ශ්‍රී ලංකාවේ COVID-19 රෝගයෙන් මරණයට පත් පුද්ගලයින්ගේ මෘත දේහ, නිර්දේශිත සම්මත සහ ආරක්ෂිත ක්‍රියාපටිපාටීන්ට, සංස්කෘතික වටිනාකම්වලට සහ ආගමික නිදහසට පටහැනි ලෙස බැහැර කිරීම සම්බන්ධ කරුණු විමර්ශනය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් 21 දෙනෙක් විසින් අත්සන් කර 2026.08.18 දිනැති යෝජනාවක් මගින් ඉල්ලා සිටියද, ගරු කථානායකතුමා විසින් එම කාරක සභාව පත් කිරීමට මේ දක්වා කටයුතු කර නොමති හෙයින්ද;

(44) පාර්ලිමේන්තු මන්ත්‍රී දයාසිරි ජයසේකර මහතා විසින් කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතාගේ ඉහතින් දක්වා ඇති ක්‍රියා කලාපයන් පිළිබඳව 2026 සැප්තැම්බර් මස 10 වන දින භාරදෙන ලද වරප්‍රසාද ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ මතු කිරීමට ඉඩ ලබා නොදෙමින් එකී වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳ තමාට අධ්‍යයනය කිරීමට අවශ්‍ය බව සභාව හමුවේ ප්‍රකාශ කරමින්, ස්වාභාවික යුක්ති මූලධර්මයේ සඳහන් "තමාගේ නඩුව තමා නොඅසනු" (Nemo judex in causa sua) යන මූලධර්මය උල්ලංඝනය කර කටයුතු කර ඇති හෙයින්ද;

(45) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඇ) වන ව්‍යවස්ථාව අනුව ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුතු බව සඳහන් කොට තිබියදී හා ඒ බව තම පූර්වගාමීන් විසින් වැඩිදුරටත් පිළිගෙන තහවුරු කර තිබියදී එය නොසලකා හැර ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක කරන පරම ආයතනය වන පාර්ලිමේන්තුවේ බලතල හා වරප්‍රසාද හැල්ලුවට ලක් කිරීමට කටයුතු කිරීමෙන් ජනතා පරමාධිපත්‍ය උල්ලංඝනය කර ඇති හෙයින්ද; අධිකරණය සම්බන්ධයෙන් ගෙන එන යෝජනා සහ සියලුම ආකාරයේ විශේෂ කාරක සභා සඳහා අවස්ථාව ලබා නොදෙමින් ජනතාවගේ පරමාධිපත්‍ය බලය ව්‍යවස්ථාදායකය තුළින් ඉටු කරවා ගැනීමට ජනතාවට ඇති අයිතිය අවහිර කර ඇති හෙයින්ද;

(46) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ ගරු විනිශ්චයකාරතුමන්ලා පත් කිරීම දිගුකාලීනව ප්‍රමාද කිරීම යන කරුණ අරබයා අවශ්‍ය නිර්දේශය ගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා ලෙස කථානායකවරයා වෙත ලබා නොදීම හේතුවෙන් එකී ධූරයන්හි පුරප්පාඩු පිරවීමට ඉඩ ප්‍රස්ථා නොලැබීම විපක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් විසින් 2026.06.12 දින කථානායක හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති ගරු වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා වෙත ලබාදෙන ලද ඉල්ලීම සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිඳු පියවරක් ගෙන නොතිබීම හේතුවෙන් ඒ මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ස්ථාවර නියෝග ප්‍රකාරව තමා වෙත පැවරී ඇති වගකීම් හිතාමතා හා දැන දැනම පැහැර හැර ඇති හෙයින්ද;

(47) අධිකරණ පද්ධතියේ ගොඩගැසී ඇති නඩු කටයුතු කඩිනම් කිරීම සඳහා සහ බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා අවශ්‍ය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින්, ස්ථාවර නියෝග 100–110 ප්‍රකාරව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලෙස ඉල්ලා 2026.08.04 දින විපක්ෂනායක තුමා ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් 18 දෙනෙකු විසින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් අවශ්‍ය පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් ගරු කථානායකවරයා වෙත පැවරී ඇති වගකීම නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තුව තුළ සිය ව්‍යවස්ථාදායක කාර්යභාරය, විශේෂයෙන්ම ජනතාවගේ ගැටලු පාර්ලිමේන්තුව ඉදිරියේ ඉදිරිපත් කර ඒවා සඳහා විසඳුම් සෙවීමේ කාර්යය, ඵලදායී ලෙස ඉටු කිරීමට බාධාවක් ඇති වී තිබෙන හෙයින්ද; මෙවැනි තත්ත්වයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භාෂණයේ, විවාද කිරීමේ සහ පාර්ලිමේන්තු කටයුතුවල නිරත වීමේ වරප්‍රසාදවලට බලපෑමක් ඇති කරන තත්ත්වයක් වන අතර, එය 1953 අංක 21 දරන පාර්ලිමේන්තු පනතේ (බලතල හා වරප්‍රසාද)I කොටසේ 3 වන වගන්තිය යටතේ සහතික කර ඇති වරප්‍රසාදවලට අදාළ වන කරුණක් වන හෙයින්ද; එසේම, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව නිසි පරිදි ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගැනීම ස්ථාවර නියෝගවල අරමුණ හා ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන්ද ගැටලුකාරී තත්ත්වයක් ඇති කරවන හෙයින්ද, එවැනි ක්‍රියාමාර්ග නොගැනීම, 1953 අංක 21 දරන පාර්ලිමේන්තු බලතල හා) පනතේ උපලේඛනයේ ආ කොටසේ (වරප්‍රසාද1 වන වගන්තියේ සඳහන් පාර්ලිමේන්තුවේ යම් නියමයකට අවනත නොවීමක් වන හෙයින්ද;

(48) උක්ත විශේෂ කාරක සභාව පත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග නොගැනීම ඇතුළුව, විශේෂ කාරක සභා 3ක් පත් කිරීම ප්‍රමාද කිරීමෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමෙන්, පාර්ලිමේන්තුව සතු අධීක්ෂණ බලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ක්‍රමයක් වන විශේෂ කාරක සභා පද්ධතිය අඩාල කර, එම අධීක්ෂණ බලය දුර්වල කරන ලද හෙයින්ද;

(49) උක්ත විශේෂ කාරක සභාව ලබා නොදීම හේතුවෙන් තම වරප්‍රසාද උල්ලංඝනය වූ බවට ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් 2026.10.03 දිනැතිව කථානායකවරයාට යොමුකළ වරප්‍රසාද කඩවීම අතාර්කික සහ එකිනෙකට සම්බන්ධ නොවන කරුණු දක්වමින් හා අයුතු අභිමත බලයක් කථානායකවරයාට ඇති බවට ආරෝපණය කරගනිමින් කථානායක නියමයක් නිකුත්කොට එම වරප්‍රසාද ගැටලුව ප්‍රතික්ෂේප කළ හෙයින්ද; එවැනි කතානායක තීන්දු තුළින් කථානායක තීන්දුවක තිබිය යුතු ප්‍රශස්ථ බව නැතිකළ හෙයින්ද; එවැනි තීන්දු මගින් තම තනතුරේ බලය අවභාවිත කර ඇති බවට බැලූ බැල්මට පෙනී යන බැවින්ද;

(50) ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමාට 2025 මාර්තු 19 සිට මැයි 9 දක්වා එතුමාගේ පාර්ලිමේන්තු කතා සජීවී විකාශයෙන් බැහැර කර, නිසි විමර්ශනයක් හෝ පිළිතුරු දීමට අවස්ථාවක් හෝ නොදී සිදු කළ බවත්, පසුව වරප්‍රසාද කමිටුව විසින් එතුමා නිර්දෝෂී බව තීරණය කිරීමෙන් එම තහනමේ පදනම වැරදි බව තහවුරු වී ඇති බවත්, එමගින් ස්වාභාවික යුක්තිය සහ නිසි ක්‍රියාපටිපාටිය උල්ලංඝනය වී ඇති බවත් නිරීක්ෂණය වන හෙයින්ද; නිසි සාක්ෂි විමසීමක් හෝ අවම කරුණු විමසීමක්වක් සිදු නොකර අසත්‍ය සාක්ෂි පදනම් කරගනිමින්, ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් තේරීපත් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙ පාර්ලිමේන්තුව තුළ කටයුතු කිරීමේ අයිතිය සහ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය වැළැක්වීමට හිතාමතාම කටයුතු කළ හෙයින්ද;

මෙම පාර්ලිමේන්තුවේ කථානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා විසින් තම ධුරයේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී ඉහතින් දක්වන ලද කරුණු කාරණා එකක් හෝ කිහිපයක් හේතුවෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත යටතේ දූෂණය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතේ සිදුකරනු ලබන විමර්ශනයන්ට බලපෑම් සිදුවන ආකාරයෙන් කටයුතු කිරීම හා ලබැඳියාවන් අතර ගැටුම් ඇති වන ආකාරයෙන් කටයුතු කිරීම යන ක්‍රියා හේතුවෙන් එකී පනත යටතේ වරදවල් එකක් හෝ කිහිපයක් ස්ථාපනය වී ඇති හෙයින්ද;

තවද, ඉහතින් දක්වන ලද කරුණු කාරණා එකක් හෝ කිහිපයක් හේතුවෙන් 1982 අංක 12 දරන පොදු දේපළ පනත යටතේ රාජ්‍ය දේපළ අවභාවිතය, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 386 හා 388 වගන්ති යටතේ වන සාපරාධී හා සාවද්‍ය පරිහරණය හා සාපරාධී විශ්වාසය කඩ කිරීම යන වරදවල් එකක් හෝ කිහිපයක් ස්ථාපනය වී ඇති හෙයින්ද;

තවද, තමා විසින් සිදුකරන ලද දූෂණ වංචා ක්‍රියා පාර්ලිමේන්තුවට හා මහජනතාවට හෙළිවීම වැළැක්වීම සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හා 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යටතේ සඳහන් විධිවිධාන හිතාමතා චේතනාන්විතවම උල්ලංඝනය කර හා අවභාවිත කර ඇති හෙයින්ද;

තවද, 1953 අංක අංක 21 පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් 2018 මාර්තු මස 07 වන දින අනුමත කරනු ලදුව, 2018 අප්‍රේල් මස 15 වන දින සිට ක්‍රියාත්මක විය යුතුයැයි සම්මත කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහයේ සඳහන් විධිවිධාන එකක් හෝ කිහිපයක් හිතාමතා දැන දැනම උල්ලංඝනය කර ඇති හෙයින්ද;

තවද, 2026 අප්‍රේල් මස 07 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කර සම්මත කරන ලද ස්ථාවර නියෝග එකක් හෝ කිහිපයක් හිතාමතා දැන දැනම බරපතළ ලෙස උල්ලංඝනය වන අයුරින් කටයුතු කර ඇති හෙයින්ද;

පාර්ලිමේන්තුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යන උත්තරීතර ආයතන පිළිබඳව මහජන විශ්වාසය කඩවන ලෙස කථානායකවරයා කටයුතු කර ඇති හෙයින් ද;

කථානායකවරයා පක්ෂග්‍රාහීව කටයුතු කරන බව පැහැදිලිවම ප්‍රදර්ශනය කරමින් කථානායක ධුරයේ ස්වාධීනත්වය ද, ගෞරවය ද, බරපතළ ලෙස උල්ලංඝනය කර ඇති හෙයින් ද;

අපක්ෂපාතිව පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීමට බැඳී සිටින කථානායකවරයා විසින්ම මන්ත්‍රීවරයන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද කඩකර ඇති හෙයින් ද;

කථානායක ධුරයේ කාර්යයන් හා වගකීම් ඉටු කිරීම පැහැර හැර ඇති හෙයින්ද; සහ

එබැවින්, වර්තමාන කථානායකවරයා රටේ උත්තරීතරම ආයතනය වන පාර්ලිමේන්තුවේ ප්‍රධානත්වය දැරීම සදාචාරාත්මකව හා නීත්‍යානුකූලව ද නොසුදුසු වන හෙයින් ද;

කථානායක ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා කෙරෙහි තවදුරටත් විශ්වාසයක් නොමැති බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

| # | මන්ත්‍රීතුමාගේ නම | අත්සන |
|---|---|---|
| 1. | [signature] | [signature] |
| 2. | ගයන්ත කරුණාතිලක | [signature] |
| 3. | දයාසිරි ජයසේකර | [signature] |
| 4. | J.C. Alawathuwala | [signature] |
| 5. | Rohitha Abeygunawardhana | [signature] |
| 6. | Sujeewa Senasinghe | [signature] |
| 7. | S.M. මරික්කාර් | [signature] |
| 8. | Nalin Bandara Jayamaha | [signature] |
| 9. | Ajith P. Perera | [signature] |
| 10. | Nizam Kariapper | [signature] |
| 11. | N.T.M. Thahir. | [signature] |
| 12. | චාමර සම්පත් දසනායක | [signature] |
| 13. | Dr. Ramanathan Archchuna | [signature] |
| 14. | K. Sujith Sanjaya Perera | [signature] |
| 15. | චානක මාදුගොඩ | [signature] |
| 16. | රෝහිණී විජේරත්න | [signature] |

CamScanner

| # | මන්ත්‍රීතුමාගේ නම | අත්සන |
|---|---|---|
| 17. | [illegible] | |
| 18. | V. Radhakrishnan | |
| 19. | Hector Appuhamy | |
| 20. | Chamindranee Kiriella | |
| 21. | W.M Rohana Bandara | |
| 22. | [illegible] | |
| 23. | [illegible] | |
| 24. | [illegible] | |
| 25. | Chithral Fernando | |
| 26. | Suraja Rajinyle. | |
| 27. | Chathura Galappaththi | |
| 28. | [illegible] | |
| 29. | Harsha de Silva | |
| 30. | Chaminda Wijesiri | |
| 31. | Habeeb Rifan | |
| 32. | Harshana Rajakaruna, | |
| 33. | IMRAN MAHAROOF | |
| 34. | Kins Nelson | |
| 35. | Amila Prasad. | |

| # | මන්ත්‍රීතුමාගේ නම | අත්සන |
|---|---|---|
| 36. | Dilith Jayaweera | |
| 37. | Dr. MLAM. Hizbullah | |
| 38. | M.S. Uthumalebbe | |
| 39. | Mujibur Rahman | |
| 40. | Hesha Withanage. | |
| 41. | Anuradha Jayaratne | |
| 42. | Waruna Liyanage | |
| 43. | RAVI KARUNANAYAKE | |
| 44. | MANO GANESAN | |
| 45. | | |
| 46. | | |
| 47. | | |
| 48. | | |
| 49. | | |
| 50. | | |
| 51. | | |
| 52. | | |

CamScanner